
ජානකී සූරියආරච්චි

INNER COVER




කතාව චිත්‍ර
පරිගණක අක්ෂර සහ වර්ණ සංයෝජනය

## ජානකී සූරියආරච්චි


**ටිකිරි ප්‍රකාශකයෝ**

1490/8, හෝකන්දර පාර, පන්නිපිටිය.
Tel: 2847438, E-mail: janu@tikiri.com,
Web: www.tikiri.com

ප්‍රථම මුද්‍රණය - 2010

© ජානකී සූරියආරච්චි

ISBN: 978-955-1090-92-0
**Book Ref: T/10/173**

මුද්‍රණය
තරංජී ප්‍රින්ට්ස්
නො. 506, හයිලෙවල් පාර,
නාවින්න, මහරගම. Tel: 2804773

**ස්තුතිය !**

මගේ පොත්වල අඩු පාඩු නොබැලුවද නිතරම මා ළඟ හිඳිමින් මගේ සියලු දුක සැප බලන මගේ ආදර අම්මාටත්, මා ඉල්ලූ, හැකි සියලු දේ මට ලබාදුන් මගේ ආදර තාත්තාටත්, “හරිම කරදරේ” කියමින් වුවද, මට නිරන්තුරුවම උදව් කරන (මගේ එකම පොතක්වත් කියවා නැති) මගේ ආදර මල්ලිටත්, මට අකුරු කියාදී මඟ පෙන්වූ මගේ ආදර ආච්චීටත්, මට සෙවනැල්ලක් මෙන් සිටින මගේ ආදර ලොකු අම්මාටත්, මගේ කතන්දර කියවා අඩුපාඩු පෙන්වාදෙන මගේ ආදර මිතුරු මිතුරියන්ටත්, භාෂාවේ මා නොදත් දේ මට හොඳින් කියාදුන් මහාචාර්ය ජේ. බී. දිසානායක මහතාට හා මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මියටත්, කලට වේලාවට මුද්‍රණ කටයුතු නිමකර දුන් පාලිත පෙරේරා මහතාටත්, වචනයකින් හෝ මා දිරිමත් කළ සියලුම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය !



**ජානකී සූරියආරච්චි**
1490/8, හෝකන්දර පාර,
පන්නිපිටිය.
Tel: 2847438
10-08-2010

**මෙම කතන්දරය සකසා ගත් කටවහරකින් ලියැවී ඇති අතර මෙහි එන නම් ගම්, ගස් වැල්, ආහාර පාන ආදී සියල්ල මෙන්ම රටද මනඃකල්පිත බව සලකන්න.**

# රසුමන්දි



සෝනංජා ගඟ අයිනෙ කුඹකුයෝසා ගහක් යට තිබුණා පුංචි ගෙදරක්. ගෙදර පුංචි වුණාට, ගෙදර ඔළුගෙඩි ගණන ගැන්නොත් නම් අත් දෙකේම ඇඟිලිවලටත් වඩා වැඩියි. ගෑනු ළමයිම දහදෙනෙක් ! ඒ විතරක් නෙමෙයි, මේ ගෙදර තවත් එක්කෙනෙක් හිටියා වැඩිපුර. ඔව් වැඩිපුර ! ඒ තමයි පුංචි රසුමන්දි. අම්මා තාත්තා නැති දරුවෙක් කාගෙ හරි ගෙදරක නවතිනවා ඇරෙන්න වෙන මොනවා කරන්නද? ඒ නිසා තමයි ලොකු මාමාටත් අකමැත්තෙන් වුණත් රසුමන්දිව ගෙදර නවත්වගන්න වුණේ. "කොයි තරම් ලොකු උදව්වක්ද ඒක. නැත්නම් බඩ ඇතුළෙන් පණු පැංචෝ කොනිති ගහනකොට තෙතබු කරලක්වත් ඉල්ලගන්නෙ කාගෙන්ද?" රසුමන්දිට හිතුණෙ එහෙමයි.

මේ ගෙදර ගෑනු ළමයි දහදෙනාට බෝනික්කො හිටියා දහ දෙනෙක්. ඒත් පුංචි රසුමන්දිට එකම එක බෝනික්කෙක්වත් හිටියෙ නෑ. රසුමන්දිත් බෝනික්කියකට ආසා ඇති කියලා ලොකු නැන්දාට අමතක වෙන්න ඇති. ලොකු නැන්දාගෙන් බෝනික්කෙක් ඉල්ලන්න නම් එයා කවදාවත් හිතුවෙ නෑ. දවසකට තෙතබු කරලක්ම දෙනකොට තව බෝනික්කොත් ඉල්ලන්න පුළුවන්ද?

ඒත් අඩුම තරමින් අක්කලාගෙ බෝනික්කෙක් අල්ලන්නවත් ඇත්නම් කියලා රසුමන්දිට සැරින් සැරේ හිතුණා. ඒත් කොහොමද? අක්කලාගෙ බෝනික්කො දිහා බලන්නවත් අවසරයක් තිබුණෙ නැනෙ. වෙලාවකට රසුමන්දිට හිතුණා, තෙතබු කරල් වෙනුවට බෝනික්කෙක් දෙන්න බැරිද කියලා නැන්දාගෙන් අහන්න. බඩගින්න ඉවසුවත් බෝනික්කෙක් නැති එක ඉවසන්නෙ කොහොමද පුංචි පොඩිත්තියක්?

ඉතින් එදා උදේත් වෙනදා වගේම බෙලෙක් පිඟාන අරගෙන රසුමන්දි පිළ උඩ වාඩි වුණා. තෙතබු කරල් තැම්බෙන සුවඳට රසුමන්දි නහය ඇල්ලුවා. ඒකෙන් බඩගින්න වැඩි වෙනවද, අඩු වෙනවද කියලා නම් රසුමන්දිට හිතා ගන්න බැරි වුණා. නැන්දා නම් කියන්නෙ එයා පොඩි නිසා උදේට තෙතබු කරලක් කෑවාම දවසටම ඇති කියලයි. ඔව් ඇති, තෙතබු කරල කාලා මදි හරියට සෝනංජා ගඟෙන් බඩ පිරෙන්න වතුර බිව්වාම දවසටම හොඳටම ඇති.

අක්කලාට නම් තෙතබු කරල් ගැන වගක් නෑ බෝනික්කො නළවනවා ඇරෙන්න. අක්කලා හැමෝම පිළ උඩ හිටි රසුමන්දිට පෙන්න පෙන්නා බෝනික්කො නැළෙව්වා. බඩගින්න කොහොම වුණත් බෝනික්කෙක් අල්ලන්න නැතුව පුංචි රසුමන්දිට හාමත වගේ දැනුණා. පුංචි පැංචිගෙ පුංචි ඇස් දෙක රිදුණා. දුකට නෙවෙයි, ඇස් පිල්ලම් නොගැහුවාට.

ආයෙමත් සැරයක් බෝනික්කෙක් ඉල්ලන්න හිතුණා පුංචි රසුමන්දිට. ඒත් ඇති වැඩක් නෑ, බැණුමක් විතරයි. ඉතින් බෝනික්කො අල්ලන්න ඉල්ලලා අහපු නැති බැණුමක් නැති එකේ, තව සැරයක් ඉල්ලුවාම මොකද?

"ලොකු අක්කේ, මම ඔයාගෙ බෝනික්කිව චුට්ටක් වඩාගන්නද?" රසුමන්දි ඉන්නම බැරි තැන ඇහුවා.
"යනවා යන්න මෙතනින් !" ලොකුම අක්කා රසුමන්දිව එළවා ගත්තා. හිත රිදුණා කියලද හිතුවෙ රසුමන්දිගෙ? නෑ, රිදෙන්න තැනක් ඉතුරු වෙලා තිබුණායැ රසුමන්දිගෙ හිතේ. එයා ගියා මද්දු අක්කා ළඟට.
"මද්දු අක්කේ, මම ඔයාගෙ බෝනික්කිව චුට්ටක් අතගාන්නද?"
රසුමන්දි හිනා වෙලා හෙමින් හෙමින් ඇහුවා.
"දෙනවා හොඳවායින් ගුටියක් !"
මද්දු අක්කා කඩා පැන්නා වලස් පැංචියක් වගේ.
කඳුළු ආවා කියලද හිතුවෙ? නෑ, රසුමන්දිගෙ ඇස් දෙකට පුරුදු නෑ ඔය කඳුළු. එයා හෙමින් හෙමින් ගියා පොඩි අක්කා ළඟට.
වැරදිලාවත් එයාට දෙන්න හිතුණොත්?
"පොඩි අක්කේ, මම ඔයාගෙ බෝනික්කිව චුට්ටක් අල්ලන්නද?"
"දෙන්නම් මම හොඳ බෝනික්කෙක් !"
පිඟානත් එක්කම විසි වුණා පුංචි කෙල්ල එළියට. ඇඬුවා කියලද හිතුවෙ? නෑ, අඬනවා නම් ඉතින් අවුරුද්දකට තුන්සිය හැටපස් දවසෙම, විසිහතර පැයේම, හැට විනාඩියේම අඬන්න තමයි වෙන්නෙ.

රසුමන්දි ඉක්මනට නැගිටලා වැලි පිහදා ගත්තා දනිස් පොල්කට්ටෙ. වෙනදා තරම් හයියෙන් ගැහුවෙ නැති එක කොයිතරම් දෙයක්ද? රසුමන්දිට සතුටුයි ඒ ගැන. ඒත් අහපු බැණුම්? බැණුම් නම් මොකද, රිදෙනවායැ.





කොච්චර බැන්නත් ඉතින් හැමදාම වගේ ලුණු දාලා තම්බපු තෙතබු කරලක්ම දෙනවානෙ. අඬන්න ගියොත් ඒකත් නැතිවෙන්න බැරි නෑ.
ඔහ් ! කුස්සියේ තෙතබු කරල් බෙදනවා. පරක්කු වුණොත් ඒකත් වරදින්න බැරි නෑ. රසුමන්දි ඉක්මනට බෙලෙක් පිඟාන අරගෙන කුස්සියට ගියා. පොල්කටු හැන්ද දැම්මා මුට්ටියෙ අඩියටම. කෝ තෙතබු? මුට්ටියෙ තිබුණෙ ලුණු වතුර විතරයි. අක්කලා ටික තෙතබු ඇට හප හපා හිනා වුණා. හ්ම් ! එතන තවත් හිටියොත් තව පාරක් මිදුලට විසි වෙන්න බැරි නෑ. කෝකටත් හොඳයි එළියෙ ඉන්න එක. හුළඟත් සනීපයිනෙ.
අද ඉතින් කොහොමටත් හුළං තමයි පොඩිත්තිට !





රසුමන්දි ගියා ගඟ අයිනට. හැමදාම රසුමන්දිට තනි මකන සෝනංජා ගඟ. රසුමන්දි ගඟ අද්දරම තිබුණු කුබකුයෝසා මුලක වාඩිවෙලා ගඟට කකුල් දෙක දාගෙන පද්ද පද්දා හිටියා. කමක් නෑ, බෝනික්කෙක් නැති එකේ තෙතබු කරල නම් මොකක්ද. ඒකත් එකට අද නැතුවාට කොයි තරම් නම් තම්බපු තෙතබු කරල් මට දීලා තියෙනවද? ඒ ගැන හිතලා රසුමන්දි හිත හදාගත්තා.

හිත හදාගත්තාට මොකද සැරින් සැරේ පුංචි පැංචිගෙ බඩ ඇතුළෙන් පණු පැංචො කොනිති ගහන්න පටන් අරගෙන. ඊයෙ උදේ කාපු තෙතබු කරල දැන් බඩේ නැතුව ඇති. ආයෙත් ඉතින් තෙතබු කරලක් කන්න හෙට උදේ වෙනකල් ඉන්න එපායැ. බඩගින්න රසුමන්දිට නුපුරුදු දෙයක් නෙමෙයි. ඒ වුණාට සැරින් සැරේ ඇවිත් රිද්දනකොට නම් ටිකක් ඉවසන්න අමාරුයි.
කොහොමටත්, බඩේ වුණත් ගින්දර නිවන්න හොඳම බෙහෙත වතුර බව, පුංචි දැරිවි දැනගෙන හිටියා. රසුමන්දි සෝනංජා ගඟට නැමිලා වතුර බිව්වා මදි නොකියන්න. එන්න එපා බඩගින්න ආයෙමත්... පුංචි රසුමන්දිට රිද්දන්න !

දැන් හරි ! පුංචි බණ්ඩිය පිරිලා. රසුමන්දිට සතුටුයි. අක්කලා ජනේලෙන් එළිය බල බලා හයියෙන් නැළවිලි කවි කිව්වා. ඒ නැළවිලි කවි ජනේලයෙන් පැනලා ගං ඉවුරට ඇවිත් පුංචි රසුමන්දිට රිද්දුවා. බඩ නෙමෙයි හිත ! පුංචි දැරිවිට අද තෙතබු කරලත් නෑ, බෝනික්කිත් නෑ - තෙතබු කරලත් නෑ, බෝනික්කිත් නෑ.

රසුමන්දි පුංචි අත්දෙක බොකුටු කරලා බැලුවා. මෙන්න මෙහෙම අල්ලගන්න බෝනික්කියක් හිටියා නම්!

වතුර බිව්වම බඩගින්න අඩු වුණාට, බෝනික්කියක් නළවන්න තිබුණු ආසාව නම් වතුර බිව්වට අඩුවෙන්නෙ නැති බව රසුමන්දිට දැනුණා.



රසුමන්දි ගහේ කඳට ඔළුව තියාගත්තා. සිසිධාරා ඇල්ල පැත්තෙන් හමාගෙන ආවා හොඳ හුරතල් හුළං රළක්. කොයි තරම් සනීපයිද? රසුමන්දිට ආවා හොඳ අදහසක්. රසුමන්දි අත දාලා අල්ලගත්තා එක හුළං රළක්. මේ තියෙන්නෙ බෝනික්කෙක් ! රසුමන්දි අත් දෙකම බොකුටු කරලා අල්ලගත්තා. හරියට බෝනික්කෙක් අල්ලගත්තා වගේ. ඇත්තටම හරිම ලස්සනයි බෝනික්කි, කියලා රසුමන්දිට හිතුණා.

ඊත් ඉතින් ඔය හුළංනෙ කියලා කවුරු හරි කියයි. කිව්වත් වගේ ඒකත් හොඳ නම, "හුළං." පුංචි පැටික්කි බෝනික්කිට නමකුත් දැම්මා. කොයි තරම් අපූරු නමක්ද ඒක? කොයි තරම් සිනිඳුද? කොයි තරම් සනීපයිද? ඒ නම අල්ලගන්න පුළුවන්ද කාට වුණත්? උදුර ගන්න පුළුවන්ද කාට වුණත්? පුළුවන්ද? පුළුවන්ද?? රසුමන්දි සතුටින් හිනා වුණා. ඔන්න ඉතින් කවුරු හරි ආයෙත් කියයි "හුළං බෝනික්කියක්නෙ" කියලා. බෝනික්කියක් නැතුව දුක් වෙනවාට වඩා හුළං බෝනික්කියක්වත් නළවන එක කොයි තරම් සතුටක්ද? හොඳයි නැද්ද?
එයා බෝනික්කි තුරුල් කර ගත්තා චූටි අම්මෙක් වගේ. ගී කියන්න පටන් ගත්තා පුංචි කෝපු කිරිල්ලක් වගේ.

"සිසිධාරා ඇල්ල යටින් - සීතල පිනි බිංදු අරන්
හුළඟෙ එති මගේ අතට - ආව හුළං බෝනික්කි
ඇහැරී ඇහැරී-නැළවී නැළවී
නැළවී නැළවී-ඇහැරී ඇහැරී
නිදියන් මගේ බෝනික්කි..."

රසුමන්දි කුබකුයෝසා මුලක වාඩිවෙලා සෝනංජා ගහට කකුල් දෙක දාගෙන බෝනික්කි නැළෙව්වා. බෝනික්කි? අහ් ! නෑ “හුළං බෝනික්කි”!
ඔය අතරෙදි කැලේ පැත්තට යමින් හිටි දර කපන මාමා එතනට ආවා.
“මොකද පුංචි දැරිවි මේ කරන්නෙ, අත්දෙක වන වනා?” දර කපන මාමා රසුමන්දි දැකලා නැවතිලා ඇහුවා.
“නෑ දර කපන මාමේ, මේ මගේ හුළං බෝනික්කි. මේ බලන්න, ලස්සනයි නේද?” රසුමන්දි අතේ හිටි........ න්...නෑ අතේ “හිතාගෙන” හිටි බෝනික්කි දර කපන මාමාට පෙන්නුවා.
“ලස්සනයි පුංචි කෙල්ලේ, නුඹේ හිත වාගෙ ලස්සනයි.” දර කපන මාමා දුකෙන් කීවා. රසුමන්දි එයාගෙ දෙකක් හැලුණු දත් ටික පෙන්නලා හිනා වුණා.
“අනේ, අම්මා අප්පා නැති අසරණ නුඹ ගැන මට බොහොම දුකයි. දුප්පත් මම බෝනික්කන් හදන්න දන්නෙ නෑ. ඒත් මම නුඹට හොඳම හොඳ කුබකුයෝසා කොටයක් කපලා දෙන්නම් නළවන්න.” දර කපන මාමා ඉක්මනට කුබකුයෝසා කොට කෑල්ලක් කපලා දුන්නා.
රසුමන්දි ගොඩක් සතුටු වුණා.
ගොඩක්-ගොඩක් සතුටු වුණා.

“බොහොම ස්තුතියි දර කපන මාමේ, බොහොම ස්තුතියි. මගේ හුළං බෝනික්කි ලී බෝනික්කියක් බවට පත් වුණු හැටි හරි අපූරුයි, නේද මාමේ?”
ඒත් ඒ ටික ඇහෙන්න කලින් දර කපන මාමා ඉක්මනට එතනින් යන්න ගියා.

“ඉර පායන සීත උදෙන් - කුබකුයෝසා කැලේ මැදින්
හෙමින් හෙමින් මගේ ළඟට - ආ මගෙ ලී බෝනික්කි
ඇහැරි ඇහැරි නැළවි නැළවි
නැළවි නැළවි ඇහැරි ඇහැරි
නිදියන් මගෙ බෝනික්කි...”
පුංචි කෙල්ල ලී බෝනික්කි නැළෙව්වා සතුටින්. හිතෙන හිතෙන කවි සිංදු කීවා, මදි නොකියන්න. සතුට වැඩිකමට බඩගින්නත් අමතක වෙලා වගේ.
එතකොට අර තෙතබු කරල? ආ, තෙතබු නම් මොකක්ද, ඊයෙ උදෙත් කෑවානෙ.



ඒත් හිත එහෙම කීවාට තෙතබු කරල පුංචි දැරිවිගෙ හිතට රිංගුවා සැරින් සැරේ. එයා ඒ ගැන නොහිතාම ඉන්න මහන්සි ගත්තා. තෙතබු කරල නැති වුණාට කමක් නෑ, දැන් බෝනික්කියක් ඉන්නවානෙ. ඒක කොයි තරම් දෙයක්ද. තෙතබු කරලයි බෝනික්කියි දෙකම නැති වුණා නම්? හිත හදාගන්න හැදුවා පුංචි කෙල්ල. ඒත් බඩ නම් හිරිහැර කළා ගොඩක්. බඩගින්න දැනෙන්නෙ බඩටනෙ, හිතට නෙමෙයිනෙ. ඒත් කොහොම හරි අර වටේම කලුවර වෙලා- දාඩිය දාලා- ඇඟ පණ නැති වෙන ලෙඩේ නම් ආවෙ නෑ, හොඳ වෙලාවට.



ඔන්න ඔය අතරෙදි ගං ඉවුර දිගේ ඇවිදගෙන ගියා කැටයම් මාමා. ගං ඉවුරෙ වාඩිවෙලා ලී කොටයකට ගී කිය කියා නළවන රසුමන්දි දැකලා කැටයම් මාමා නැවතුණා.

"මොකද පුංචි දැරිවි ලී කොටයක් වන වනා කරන්නෙ?"

"නෑ කැටයම් මාමේ, එයා මගේ ලී බෝනික්කි. මේ බලන්න, ලස්සනයි නේද?"

"ලස්සනයි පුංචි කෙල්ලේ, නුඹේ හිත වාගෙ ලස්සනයි." කැටයම් මාමා දුකෙන් කීවා. රසුමන්දි එයාගෙ දෙකක් හැලුණු දත් ටික පෙන්නලා හිනා වුණා.

"අනේ, අසරණ නුඹට ලස්සන බෝනික්කො හදලා දෙන්න මම දන්නෙ නෑ. ඒත් මම නුඹට ඔය ලී කොටයෙන් බෝනික්කෙක් කපා දෙන්නම්."

කැටයම් මාමා ඉක්මනට කුඹකුයෝසා කොටය අරගෙන බෝනික්කෙකුගේ හැඩයක් කපලා දුන්නා. රසුමන්දි සතුටු වුණා. ගොඩක්-ගොඩක්-ගොඩක් සතුටු වුණා.

"බොහොම ස්තුතියි කැටයම් මාමේ, බොහොම ස්තුතියි. මගේ හුළං බෝනික්කි කැටයම් බෝනික්කියක් බවට පත්වුණු හැටි කොයිතරම් අපුරුයිද, නේද කැටයම් මාමෙ?"

ඒත් ඒ ටික ඇහෙන්න කලින් කැටයම් මාමා එතනින් යන්න ගිහින්. පුංචි කෙලි පොඩ්ඩ කැටයම් බෝනික්කිව නැළෙව්වා. ආදරෙන් නැළෙව්වා.

"කුරුලු පැටව් ඉගිලෙද්දි - සමනල් මල් හිනැහෙද්දි
පුළුන් වගේ පාවි පාවි - ආ කැටයම් බෝනික්කි
ඇහැරී ඇහැරී නැළවී නැළවී
නැළවී නැළවී ඇහැරී ඇහැරී
නිදියන් මගේ බෝනික්කි..."

ජළහට ගඟ දිගේ පාරු ගාගෙන ආවෙ රෙදි විකුණන මාමා. හැඩේකට කැපූ ලි කැල්ලක් තියාගෙන ඒ පැත්තට මේ පැත්තට නළවන රසුමන්දි දැකලා රෙදි විකුනණ මාමා නැවතුණා.
"පුංචි දැරිවි මොකද මේ කපාපු ලි කැල්ලක් වන වනා කරන්නෙ?"
"නෑ රෙදි මාමෙ, එයා මගේ බෝනික්කි. මේ බලන්න ලස්සනයි නේද?"
"ලස්සනයි, නුඹේ හිත වාගෙ ලස්සනයි." රසුමන්දි එයාගෙ දෙකක් හැලුණු දත් ටික පෙන්නලා හිනා වුණා.
"අසරණ පුංචි කෙල්ල, මට නුඹ ගැන බොහොම දුකයි. මම ලස්සන බෝනික්කන් හදන්න දන්නෙ නෑ. ඒත් මට පුළුවන් පරණ හෝෂි රෙද්දකින් ගවුමක් මහලා දෙන්න නුඹේ බෝනික්කට."

රෙදි මාමා ඉක්මනට හෝෂි රෙදි කැල්ලකින් ගවුමක් මහලා දුන්නා. දුඹුරු පාටයි මඩ කොළ පාටයි !
හරිම ලස්සන පාට දෙක. හොඳයි නැද්ද?
රසුමන්දි ගොඩක් සතුටු වුණා.
ගොඩක්-ගොඩක්-ගොඩක්-ගොඩක් සතුටු වුණා.
"බොහොම ස්තුතියි රෙදි මාමෙ. බොහොම ස්තුතියි. මගේ හුළං බෝනික්කි හෝෂි බෝනික්කියක් බවට පත්වුණු හැටි කොයි තරම් අපූරුයිද, නේද රෙදි මාමෙ?"
ඒ ටික ඇහෙන්න කලින් රෙදි මාමා පාරුව පැදගෙන යන්න ගිහින්. පුංචි කෙල්ල හෝෂි බෝනික්කිව නැළෙව්වා. සතුටින් නැළෙව්වා. ඒ පැත්තට මේ පැත්තට-මේ පැත්තට ඒ පැත්තට නැළෙව්වා.
"ඇත ඇත ඇත ලොවින් - හෝෂිමිංෂි කැලේ උඩින්
හොරෙන් හොරෙන් මගෙ තුරුළට - ආව හෝෂි බෝනික්කි
ඇහැරි ඇහැරි නැළවි නැළවි
නැළවි නැළවි ඇහැරි ඇහැරි
නිදියන් මගේ බෝනික්කී..."
රසුමන්දිගෙ හිත පාවුණා හීන ලෝකෙක... පුංචිම පුංචි හීන ලෝකෙක... ආදරේ පිරිච්ච හීන ලෝකෙක...
සතුට වැඩිකමට බඩගින්නත් අමතක වෙලා වගේ.

බඩගින්න අමතක වෙලා කීවට බඩේ හිටි පණු පැංචො පුංචි බණ්ඩිය චුට්ට චුට්ට කොනිති ගැහුවා. ඒක නොදැනෙන්න පුංචි රසුමන්දි බෝනික්කි නළවන්න හැදුවා. ඒත් කොහෙද.... පණු පැංචන්ගෙන් බේරිල්ලක් නෑ.



බැරිම තැන පුංචි රසුමන්දි ආයෙත් ගඟට බැහැලා වතුර බිව්වා. ඇත්තටම වතුර හරි රසයි. රසයි නේ? ඔව්, හරි රසයි. ඒ රස දන්නෙ රසුමන්දියි පණු පැංචනුයි විතරයි. සෝනංජා ගඟ ඇතිවෙනකල් වතුර දුන්නා පුංචි කෙල්ලට. අනේ අසරණ ගඟ වෙන මොනවා දෙන්නද, බඩගින්නෙ හිනාවෙච්ච බෝනික්කො නළවන පුංචි කෙල්ලට? දැන් හරි ටික වෙලාවකට.

රසුමන්දි ආයෙමත් කුබකුයෝසා මුල උඩ වාඩිවෙලා බෝනික්කි නළවන්න පටන්ගත්තා, ඒ පැත්තට මේ පැත්තට. ගී කිව්වා ලස්සන කෝපු කිරිල්ලියක් වගේ.

ඊළඟට එතනින් යන්න ගියේ පින්තාරු මාමා.
"මොකක්ද පුංචි දැරිචි, මොකක්ද ඔය වන වනා ඉන්නෙ?" පින්තාරු මාමා කළු පාටයි සුදු පාටයි තීන්ත බාල්දි දෙක බිම තියලා ළඟට ආවා.
"පින්තාරු මාමෙ, මේ මගේ හෝෂි බෝනික්කි. මේ බලන්න ලස්සනයි නේද?"
"ලස්සනයි නුඹේ හිත වාගෙ ලස්සනයි. මට නුඹ ගැන බොහොම දුකයි. මම ලස්සන බෝනික්කන් හදන්න නම් දන්නෙ නෑ. ඒත් මට පුළුවන් මගේ තීන්තවලින් ඔය බෝනික්කව පින්තාරු කරල දෙන්න."
පින්තාරු මාමා කීවා.
රසුමන්දි එයාගෙ දෙකක් හැලුණු දත් ටික පෙන්නලා හිනා වුණා. පින්තාරු මාමා එයාගෙ කළු, සුදු තීන්තවලින් ලස්සනට පින්තාරු කළා. ලස්සනට? කළු සුදුවලින්? ඔව් ලස්සනට ! සුදුපාට කම්මුල් හරි ලස්සනයි. බැලුවාම රෝස පෙති වගේ, කලු පාට ගෑ ඇස් දෙක හරියට නිල් කැට දෙකක් වගේ, කළු පාට ගෑ කොණ්ඩෙ හරියට රන් කෙඳි වගේ, කියලා රසුමන්දිට හිතුණා. රසුමන්දිගෙ බඩ පිරුණා ගොඩාක්....ආදරේට

"බොහොම ස්තුතියි පින්තාරු මාමෙ. බොහොම ස්තුතියි. දැන් බෝනික්කි ලස්සනම ලස්සනයි. මගේ හුළං බෝනික්කි පින්තාරු බෝනික්කියක් බවට පත් වුණු හැටි හරි අපූරුයි නේද පින්තාරු මාමෙ." රසුමන්දි ගොඩක් සතුටු වුණා. ගොඩක්-ගොඩක්-ගොඩක්-ගොඩක්-ගොඩක් සතුටු වුණා. හිතේ සතුට පෙණ නැගුණා.
පෙණ-පෙණ-පෙණ-පෙණ පිරිලා ඉතිරුණා.



පින්තාරු මාමා සතුටින් පිරුණු රසුමන්දිගෙ මුණ දිහා ආයෙත් සැරයක් බලලා යන්න ගියා. පින්තාරු මාමාගෙ ඇස්වල කඳුළු. බෝනික්කිගෙ ලස්සන දැකලා සතුටට වෙන්න ඇති.

"හඳට යටින් තරු අතරින් - සුරංගනා ලෝකෙ ඉඳන්
වලාකුළක දැවටී ආ - මගෙ ලස්සන බෝනික්කි
ඇහැරී ඇහැරී නැළවී නැළවී
නැළවී නැළවී ඇහැරී ඇහැරී
නිදියන් මගේ බෝනික්කි...
හිනැහී හිනැහී නැළවී නැළවී
නිදියන් මගෙ බෝනික්කි..."

රසුමන්දිගෙ ඉහේ මලක් පිපිලා වගේ. මලක් නෙමෙයි මල් වත්තක්ම පිපිලා වගේ. රසුමන්දිට හරි සතුටුයි. බෝනික්කි හරිම ලස්සනයි. ඇත්තමයි බෝනික්කිගෙ ලස්සන දැක්කාම බඩගින්න ආයෙත් චුට්ටක් විතර අඩු වුණා. ඔ - ඔව් ඒ වගේ දැනුණා. ඒත් හිතට හොරෙන් බඩගින්න ඇවිත් රසුමන්දිට චුට්ට චුට්ට රිද්දුවා.

ගේ පැත්තෙන් හොඳ සුවඳක් ආවා. හවසට කන්න රයිබියෝනා හදලා වගේ. රසුමන්දිට නොදැනීම වගේ ඒ පැත්ත බැලුණා. රස කෑම නම් නැතත් කමක් නෑ, නැන්දාට දුක හිතිලා අඬගැහුවොත් අර තෙතබු කරල කන්න එන්න කියලා. රසුමන්දි ගේ පැත්තට හැරිලා බෝනික්කි නැළෙව්වා.

එතකොටම එතනින් ආවා සුකුරුදාස් සීයා, හැරමිටිය තිය තියා ගාට ගාටා.

"මොකද පුංචි කෙල්ලේ, අදත් නුඹට තෙතබු කරල වැරදුණාද?" සුකුරුදාස් සීයාට කොහොම දැනුණාද මන්දා.

"අ-අ- නැ-නැ- නැන්දා ඊයෙත් තෙතබු කරලක්ම කන්න දුන්නනෙ සීයේ. අද මම වතුර ගොඩක් බීපු නිසා තවම බඩගිනි න්-න්-නැතුව වගේ." රසුමන්දිට පැටළුණා.

එතන පහුකරගෙන යනගමන් සුකුරුදාස් සීයා තව මොනවදෝ කීවා. රසුමන්දිට ඇහුණෙ නෑ. සීයාටත් අද තෙතබු කරල වැරදිලා වගේ. රසුමන්දි බෝනික්කි තුරුල් කරගෙන කවි කීවා. තව තව තව කවි කීවා.

රසුමන්දිගෙ බඩේ උණුසුම ගොඩක් වැඩි වුණා. බෝනික්කිටත් දැනුණා. බඩ පණුවො අඬනවා ඇති. ඒත් රසුමන්දි ඇඬුවෙ නෑ. අඬලා මොකටද? ඇඬුවාම ලැබෙන දේවල් රසුමන්දිට කවදාවත් තිබුණෙ නෑනෙ.



මතක ඇති කාලෙක අඬලා නෑ රසුමන්දි. කොහොමටත් බඩගිනි වුණාම අඬලා ඇති වැඩක් නැහැ. ගඟට බැහැලා බඩ පිරෙනකල් වතුර බොනවා මිසක්.

රසුමන්දි ආයෙත් ගඟට බැහැලා වතුර බීගෙන බීගෙන ගියා. සෝනංජා ගඟේ රසම රස වතුර ! රසුමන්දිට සතුටුයි. රසුමන්දි ආයෙත් බෝනික්කි ගත්තා අතට. බෝනික්කි දිහා බලාගෙන ගී කීවා.

"හා පැංචනෙ මේ බලන්න- මුව පැටවුනෙ මේ බලන්න
මුදු හතට එපිටින් ආ - ළිහිණියනේ මේ බලන්න
මගෙ ලස්සන බෝනික්කි - එන්න එන්න මේ බලන්න
නිදියයි මාගේ තුරුලේ - එන්න එන්න මේ බලන්න..."

රසුමන්දි පුංචි කෝපු කිරිල්ලක් වගේ ගී කීවා. බඩගින්න නිසා පුංචි කිරිල්ලගෙ කටහඬ වෙවුළුවා. දෙවියනේ ! ඊයෙ උදේ ඉඳන් හාමතේ පුංචි කෙල්ල. බඩගින්න කොනිති ගහපු ඒ කටහඬ කොයි තරම් අපුරුද කිව්වොත් අතේ හිටි ලී බෝනික්කිටත් ඇහෙන්න පටන් ගත්තා. හින් හඬින් ඇහෙන්න ගත්තා

බෝනික්කි අහගෙන හිටියා. බෝනික්කිගෙ හිත කිරි ගැහුණා. පුංචි කෙල්ලගෙ බඩේ ගින්දර දිරවිච ගවුම අතරින් බෝනික්කිටත් දැනුණා. බෝනික්කිගෙ පපුව ගැහුණා. බෝනික්කි ඇස් පිල්ලම් ගැහුවා. ඇස් ඇරලා බැලුවා. රසුමන්දිගෙ පුංචි මූණ දැකලා හිනැහුණා. හීන් හඬින් හිනැහුණා. ඇස් පිල්ලම් ගහලා හිනැහුණා.

රසුමන්දිගෙ ඇස් උඩ ගියා. හුස්ම නැවතුණා. කට ඇරුණා. "බෝනික්කිට පණ ඇවිත් ! බෝනික්කිට පණ ඇවිත් !" රසුමන්දි කෑ ගැහුවා. කුබකුයෝසා මුලින් නැගිටලා ඉවුරට පැන්නා. බෝනික්කි බදාගෙන කෑ ගැහුවා. කැරකි කැරකි කෑ ගැහුවා. ගේ ඇතුළේ රසම රස රයිබියෝනා කමින් හිටි අක්කලා රසුමන්දිගෙ කෑ ගැහිල්ලට එළියට දුවගෙන ආවා, මොකක්ද මේ අරුමෙ කියලා බලන්න.

"ලොකු අක්කේ ! මද්දු අක්කේ ! මේ බලන්නකො මගෙ ලස්සන බෝනික්කි ! ඇස් නටවනවා. හිනා වෙනවා. බෝනික්කිට පණ ඇවිත්! බෝනික්කිට පණ ඇවිත් !" රසුමන්දි තොරතෝංචියක් නැතුව කියෙව්වා. අරුම පුදුම බෝනික්කි බලන්න අක්කලා ටික වටවුණා.





"මෙන්න අක්කෙ වඩාගන්න මගෙ බෝනික්කි. වඩාගන්න" අනේ අහිංසක පුංචි කෙල්ල බෝනික්කිව දික්කලා අක්කලාට.

මද්දු අක්කා බෝනික්කිව ගත්තා අතට. ඒ පැත්ත මේ පැත්ත බැලුවා. ඇස් දිලිසුණා. කට ඇද වුණා. ඊළඟ තත්පරේ බෝනික්කි ගඟේ. අනේ රසුමන්දිට හරියට හිනා වෙන්නවත් වෙලාවක් ලැබුණෙ නෑ බෝනික්කි එක්ක. පුංචි පැටික්කිගෙ පපුව මැද්දෙ ලොකුම ලොකු විදුලියක් කෙටුවා අකුණකුත් එක්කම. ඇස් පිල්ලම් ගහන පමාවෙන් බෝනික්කි දිය පාරත් එක්ක වේගෙන් ඇදිලා ගියා.





අක්කලා ටික හයියෙන් හිනා වුණා. උඩ පැන පැන හිනා වුණා. රසුමන්දිට ඒවා ඇහුණෙ නෑ. එයා දිව්වා ඉවුර දිගේ විදුලියක් වගේ. ගඟේ පාවෙන බෝනික්කි දිහා බලාගෙන වතුර පාරෙ වේගයෙන්ම දිව්වා. හාමතේම දිව්වා. ගල් මුල් ඇනි ඇනි කටු අකුල්වලට සීරෙමින් දිව්වා. දැනුණාද රසුමන්දිට? නෑ දැනුණෙ නෑ. ඇඬුවාද රසුමන්දි? නෑ ඇඬුවෙ නෑ.

බෝනික්කි වතුරට ගහගෙන සිසිධාරා ඇල්ල ළඟටම ආවා. ඇල්ලෙන් පහළට වැටෙන්න කලින් බේරගන්න ඕනෙ. නැත්නම් අනේ පුංචි බෝනික්කිට මොනවා වෙයිද දන්නෙ නෑ. රසුමන්දි හිතේ විරිය කකුල් දෙකට අරගෙන ඇල්ල කොනටම දිව්වා. අනේ ඒත් ඊට කලින් බෝනික්කි ඇල්ලෙන් පහළට වැටුණා. රසුමන්දිගෙ හුස්ම නැවතෙන්න ගියා. න්-නෑ, නැවතෙන්න දුන්නෙ නෑ රසුමන්දි. එයා ඉක්මනට එල්ලුණා පෙරම්බරා වැල්වල. පුංචි වඳුරු පැංචියෙක් වගේ පෙරම්බරා වැල්වල එල්ලිලා ඇල්ල පහළට රූටලා බැස්සා.

කටු අතුවලට කකුලෙ තැනින් තැන සීරිලා ලේ එන්නත් ගත්තා. ආ ඒක නම් මොකක්ද? ඒක දැනුණෙ නෑ රසුමන්දිට. එතකොට අර තෙතබු කරල? ඒකත් මතක නෑ රසුමන්දිට. එතකොට අර කොනිති ගහන බඩේ ගින්දර? බඩේ ගින්දර නම් මොකක්ද? ඒ වගේද බෝනික්කි ගඟට වැටිලා හිතේ ගින්දර නම් කොච්චරක්ද?

රසුමන්දි ඇල්ල පහළ ගලක් මුලක් පඳුරක් වැලක් ගානෙ බෝනික්කි සෙව්වා. ඇල්ල පහළ දිය කොටුව පීර පීරා සෙව්වා. හැන්දෑ වෙනකල් සෙව්වා. හිතට නොදැනුණාට ඇඟට හාමත දැනිලාදෝ රසුමන්දි වැනුණා, හුළඟට පැද්දෙන තෙතබු කරලක් වගේ. ඒත් සෙව්වා බෝනික්කිව. අන්තිමේදි කළුවර වැටීගෙන එනකොට හම්බ වුණා බෝනික්කිව. පඳුරක් අස්සෙ හිරවෙලා. අනේ බෝනික්කිගෙ පණ ගිහින්. බෝනික්කි ඇස් ඇරියෙත් නෑ. හිනා වුණේත් නෑ. කතා කළේත් නෑ. රසුමන්දිගෙ පපුවෙ දෙවෙනි සැරේටත් අකුණක් කෙටුවා. ඒත් පුංචි බලාපොරොත්තුවක් ඒ එක්කම ඇවිත් අකුණ මැද්දට පැන්නා. පැංචිගෙ හිත පිරිමැද්දා. කොහොමහරි ආයෙත් පණ ගන්න පුළුවන් වෙයි. ඔව් පුළුවන් වෙයි. රසුමන්දිට බලාපොරොත්තුව කිව්වා.

පුංචි පැංචි ඉක්මනට බෝනික්කි පපුවට තුරුල් කරගෙන කවි කිව්වා. ඉස්සරෝම වගේ ලතාවකට නෙමෙයි. හරියට ලිඳේ වැටිච්ච පූසි පැටියෙක් ගන්න බාල්දියක් හොයනවා වගේ. කළුවරත් වැටුණා. ඉන්නෙ කොහෙද, යන්නෙ කොහෙද, කන්නෙ මොනවද... රසුමන්දිට ඒකෙ වගක් නෑ. කොහොම හරි ආයෙත් පණ ගන්න ඕනෙ බෝනික්කිගෙ. රසුමන්දි තව තවත් ගී කිව්වා. කවි කිව්වා. සුකුරුදාස් සීයලාගෙ ආච්චි හෝෂි ගහ උඩ තියෙන පිළිමෙට ගාථා කියනවා වගේ.

"නයි පෙණගල උඩින් එබෙන ඉරු දෙවියනි මේ බලන්න
පාළු කැලේ කළු කපනා සඳ දෙවියනි මේ බලන්න
මගේ පුංචි බෝනික්කිට ඇස් අරින්න පණ එවන්න
මගේ පුංචි බෝනික්කිට හිනා වෙන්න පණ එවන්න..."

කෝ, ආවෙ නෑ---පණ. රසුමන්දි තව කිව්වා.
තව තව කිව්වා. තව- තව- තව- තව- තව කිව්වා.



ඉරුදෙවියො නාවත්, සඳදෙවියො නාවත්, ලස්සනම ලස්සන දේවතාවියක් නම් එතනට ආවා, රසුමන්දිගෙ කටහඬ ඇහිලා.

"මොකද පුංචි දරුවෝ ඔතන කළුවරේ කරන්නෙ?" ලස්සන දේවතාවි ඇහුවා.

"ම-මගේ බෝනික්කි ගඟට වැටිලා පණ ගියා. දැන් ම-මම මේ ආයෙත් පණ ගන්නයි මහන්සි වෙන්නෙ."

"ඉතින් කවි කිව්වට පණ ඒවියැ?"

"මගේ බෝනික්කිට පණ ආවෙ කවි කියනකොටනෙ. ඒ නිසා ආයෙත් කවි කියනකොට, කියනකොට පණ ඒවි." රසුමන්දි කීවා.

"හ්ම්, ඔය හැටි කවි කිය කියා මහන්සි වෙන්න ඕනෙ නෑ. මම ඔය දරුවට උදව් කරන්නම්. එන්න අද රෑ අපේ ගෙදර නවතින්න. හෙට උදේට බැරියැ පණ දෙන්න, දෙන්නගෙන් කාට වුණත්."

අනේ කොයි තරම් දෙයක්ද ඒක.

දේවතාවි රසුමන්දිව එයාගෙ ගෙදර එක්කගෙන ගියා. දේවතාවියකගෙ ගෙයක් කිවාට කළුවරම කළුවරයි. ටිකක් ගඳයිත් වගේ. ගඳ නම් මොකක්ද? හෙට උදේට පණ දෙන්න පුළුවන් නම්.



මේසෙ උඩ රසම රස කෑම ගොඩක් තිබුණා. රයිබියෝනා, තෙතබු, සුලෝගු, පිරිලා. කලින් දා උදේ තෙතබු කරල කෑවට පස්සෙ පුංචි දැරිවි මේ වෙනකොට පස් වරුවක් හාමතේ. රසුමන්දි ඒ දිහා බැලුවා... නෙවෙයි, බැලුණා... නෙමෙයි, අහක බලාගෙන ඉන්න බැරි වුණා. රසුමන්දිගෙ හිතේ තිබුණු දේ දේවතාවිට පෙනුණාද දන්නෙ නෑ. "හ්ම්, හොඳ රස කෑමක් දෙන්නම්කො හෙට උදේට." දේවතාවි කීවා.

ඒකත් කොයි තරම් හොඳ ආරංචියක්ද. කෑම මේසෙ වටේ කැරකි කැරකි නිල් පාට උගුඩුහාමියෙකුත් හිටියා. උගුඩුහාමිත් හාමතේද දන්නෙ නෑ.

ඊට පස්සෙ දේවතාවි පුංචි කොට්ටෙකුයි පැදුරකුයි දුන්නා නිදාගන්න. "ඇත්තටම කොයිතරම් දෙයක්ද මේ දේවතාවි හම්බ වුණු එක. හෙට උදේට මට රස කෑමත් දෙයි, මගෙ බෝනික්කිගෙ පණත් අරගෙන දෙයි." රසුමන්දි සතුටු වුණා ගොඩක්.

රසුමන්දි ජනේලෙ ළඟ පැදුර දාගෙන බෝනික්කි බදාගෙන ඇල වුණා. පැදුරට වැටුණා විතරයි රසුමන්දිට හොඳටම නින්ද ගියා. ඒත් තෙතබු, රයිබියෝනා පිරුණු ලස්සන හීනෙකට යන්තමින් ගොඩ වුණා විතරයි, කවුදෝ ජනේලෙ පහුරු ගාන්න ගත්තා. රසුමන්දි ඇහැරුණා. එයා ඉක්මනට ජනේලය ඇරලා බැලුවා. අහ්! නිල්පාට උගුඩුහාමි ! "ඇයි මේ ?"
"පුංචි දරුවෝ, ඉක්මනට පණ බේරගෙන මෙතනින් පැන ගන්න." උගුඩුහාමි කට තද කරගෙන කෙඳිරුවා.
"පණ බේරගෙන පැනගන්න? මේ තරම් ලස්සන දේවතාවියකගෙන්?"
රසුමන්දි ඇස්දෙක පිස දමමින් ඇහුවා.
"පුංචි දරුවෝ, ලස්සන වුණු පමණින් දේවතාවියක් වෙන්නෙ නෑ. අන්න දේවතාවි ගේ පිටිපස්සෙ වතුර නටවනවා, හෙට උදේ කෑමට ගන්න."
"අනේ පව්, මට රස කෑම දෙන්න දේවතාවි කොයි තරම් මහන්සි වෙනවද?" රසුමන්දි විස්සෝප වුණා.
"කෑම දෙන්න නෙමෙයි දරුවෝ, කෑමට ගන්න !"
උගුඩුහාමි රසුමන්දිගෙ නහය ඔබලා කීවා.
"කෑමට ගන්න? කාවද? මාව?"
"ඔව්, ඔව්, ඉක්මනට මෙතනින් පැනගන්න. දේවතාවියක් වගේ පෙනුණාට මේ තමයි තාම්බ්‍රවශී මායාකාරි."
"තා-ම්-බ්‍ර-ව-ශී-? අපොයි දෙවියනේ !" එතකොටයි මතක් වුණේ, සිසිධාරා ඇල්ල පාමුල තාම්බ්‍රවශී මායාකාරි. අහලා තිබුණට දැකලා තිබුණෙ නෑ නෙ.

රසුමන්දි ඉක්මනට බෝනික්කිවත් අරගෙන ජනේලයෙන් එළියට පැන ගත්තා. උගුඩුහාමි ඉක්මනට රසුමන්දිව මායිමෙන් පිට කළා. රසුමන්දි හිතෙන් ස්තුති කළා දේවතාවිට. ඒ මොකටද? රෑ නොකා උදේට කන්න හිතුවට. කොයි තරම් දෙයක්ද ඒක. රසුමන්දි සතුටු වුණා ඒ ගැන.

හඳ එළියට බෝනික්කිගෙ මූණ පෙනුණා හරි අපූරුවට. අනේ කොච්චර ලස්සනට ඇස් පිල්ලම් ගැහු බෝනික්කියක්ද? අනේ කොච්චර ලස්සනට හිනා වුණු බෝනික්කියක්ද? රසුමන්දිගෙ පපුව ඇදුම් කෑවා. පුංචි බෝනික්කිට තිබුණු ආදරේ පිරිලා ඉතිරුණා. කාත් කවුරුත් නැති පුංචි කෙල්ලගෙ හීන ලෝකෙට... හීනයක් වගේ ආ බෝනික්කි... හීනයක් වගේම යන්න ගිහින්.



ඒත් එහෙම යන්න දෙන්න පුළුවන්ද? බෑ ! එහෙම යන්න දෙන්න බෑමයි කියලා රසුමන්දිට හිතුණා. පුංචි හිත ගිනි ඇවිළුණා.

රසුමන්දි ගං ඉවුරෙ වාඩි වෙලා බෝනික්කි නැළෙව්වා. ඒ පැත්තට මේ පැත්තට නැළෙව්වා. අත රිදෙනකල් නැළෙව්වා. ඒත් කෝ? පණ ආවෙ නෑ. ඒත් පුංචි බලාපොරොත්තුව අඩු වුණේ නෑ. රෑ වෙනකල් එළි වෙනකල් - රෑ වෙනකල් එළි වෙනකල් - නළවන්න බෝනික්කි - පණ එනකල් නළවන්න බෝනික්කි

“එළිය වෙන්න - හුළං එන්න - පිණි හලන්න - හිනා වෙන්න -බෝනික්කිට පණ වුට්ටක් - අනේ දෙන්න - පණ එවන්න - එවන්න පණ - බෝනික්කිට - අපි දෙන්නට - හිනා වෙන්න -බෝනික්කිට - බෝනික්කිට - පණ එවන්න - කන්ද උඩින් - ඇල්ල යටින් -පණ එවන්න-”
උගුර බැරැණ්ඩි වෙනකල් රසුමන්දි කවි කිව්වා. කවි? කවිද මන්දා ඒවා. තාලයක් නම් තිබුණෙ නෑ. තාල ආවෙ නෑ රසුමන්දිගෙ හිතට. පුංචි කෙල්ලගෙ හිත ගිනි අරගෙන නෙ.

රසුමන්දි බෝනික්කි තුරුල් කරගෙන, කළුවරේ ගල් මුල්වල පැටළි පැටළි ගං ඉවුර දිගේ ඇවිදගෙන ගියා. යන්නෙ කොහෙද කියලා නම් අදහසක් තිබුණෙ නෑ හිතේ. ඒත් කොයි වෙලාවෙ හරි බෝනික්කිට පණ එයි කියලා නම් ලොකු අදහසක් තිබුණා. ලොකුම ලොකු අදහසක් තිබුණා.

රසුමන්දි බෝනික්කි නළව නළවා ගං ඉවුර දිගේ ඇවිද්දා. කළුවරේ ඇවිද්දා. රසුමන්දිට ගොඩක් පාළු දැනුණා. එයා තව තව කවි කීවා. නයිපෙණ ගලට උඩින් යන්තම් ඉර එනකල් කවි කීවා. අර කෝපු කිරිල්ල වගේ හුරුබුහුටියට නම් නෙමෙයි. හරියට උණ සන්නිපාතෙ හැදිච්ච බලු පැටියෙක් වගේ. එතකොට අර තෙතබු කරල? පුංචි කෙල්ලට ඒවා මතක නෑ. බඩගින්න වැඩිවෙලා, වැඩිවෙලා, වැඩිවෙලා, පුංචි බඩ හිරි වැටිලා වගේ.

පුංචි රසුමන්දි ගං ඉවුර දිගේ ඇවිදගෙන, ඇවිදගෙන ගියා. ඔහේ ඇවිදගෙන ගියා. ඔහොම යනකොට ගං ඉවුරේ තෙප්පමක් අලුත්වැඩියා කරමින් හිටි තෙප්පම්කාරයෙක් හම්බ වුණා.



පුංචි රසුමන්දිගෙ ගිනි ඇවිළුණු පුංචි හිතට හීතල හුළඟක් හැමුවා... බලාපොරොත්තු පොදියක් එක්ක. රසුමන්දිට මතක් වුණා, එක පෙළට. දර කපන මාමා, කැටයම් මාමා, රෙදි මාමා, පින්තාරු මාමා. නයි පෙණ ගලට උඩින් ඉර දෙයියො නාවාට, පාළු කැලේ මැදින් සඳ දෙයියො නාවාට, දෙයියො නම් කොයිතරම්ද සෝනංජා ගං ඉවුර දිගේ. පුංචි කෙල්ලට වැරදුණා !

රසුමන්දි ඉක්මනට ගියා තෙප්පම් තොටට. බෝනික්කි තුරුල් කරගෙන තෙප්පම්කාරයාගෙන් අහන්න වචන ගලපමින් පසු බැවා.

"මොකද ළමයො?" තෙප්පම්කාරයා පිටිපස්ස හැරිලා ගොරහැඩි හඬින් ඇහුවා.

"අ-අ-අනේ තෙප්පම් මාමේ - ම- මට මගේ -පණ ගිහින් - බෝනික්කිගෙ- පණ තිබුණා - ඊයෙ හවස - හොඳට පණ තිබුණා - ඇසි පිල්ලම් ගහලා මාත් එක්ක හිනාත් වුණා - ඔව් ලස්සනට හිනා වුණා - ඇත්තමයි හරි ලස්සනට - ඇත්තමයි - ම-ම- මගේ බෝනික්කගෙ පණ - මගේ - පණ- ගන්න බැරිද- පණ?" රසුමන්දිට පැටළුණා. තෙප්පම් මාමා විස්තරේ අහුලගත්තා.

"පණ ගන්ඩ ඈ? මොකක් කිව්වා? බූනික්කෙකුට? හෙහ් - හෙහ් - හෙහ් - කෝ බලන්ඩ."

තෙප්පම් මාමා බෝනික්කි ඒ පැත්ත මේ පැත්ත හරවලා බැලුවා. ඇස් දෙක එළිය වුණා. කට කොණකින් හිනාවක් මතුවුණා.

"තෙප්පම් ඔප දමන්න අගේ ඇති හෝෂි රෙදි කැල්ලක්." හිත කීවා.

"හ්ම්, බලමුකො. මම උත්සාහ කරන්නම්, බූනික්කිට පණ ගන්ඩ." තෙප්පම් මාමා කීවා.

රසුමන්දිගෙ ඔළුව දෙපැත්තට වැනුණා.

තෙප්පම් මාමා බෝනික්කි අරගෙන ගඟ අද්දරටම බර වුණා, බෝනික්කිට පණ දෙන්න. ඊට පස්සෙ ආපහු ඇවිත් රසුමන්දිට කතා කළා.

"අපොයි දරුවො, හරි වැඩේ නොවැ උනේ. මම බූනික්කගෙ පණ ගන්ඩ හදනකොට ඇඳුම වැටුණානෙ ගඟට. තව ඇබින්දෙන් බූනික්කත් ගඟේ. හොඳ වෙලාවට මම අමාරුවෙන් බූනික්කව බේරගත්තෙ. දැන් නම් මට පණ ගන්ඩ බැරිවෙන හැඩයි. වෙන කාගෙන් හරි අහලා බලන්ඩ."



තෙප්පම් මාමා ඇඳුම නැති පින්තාරු බෝනික්කව රසුමන්දිට දුන්නා. පුංචි පැංචිගෙ මූණ ඇද වුණා. තොල පෙරළුණා, තත්පර එකහමාරකට. ඊළඟ තත්පරේ ආයෙත් එළිය වුණා.

"අනේ - මාමෙ - ඒත් - ඒත් කොයි තරම් දෙයක්ද ගඟට නොවැටී පින්තාරු බෝනික්කිව ඉතුරු වුණු එක - බෝනික්කි වැටුණෙ නෑ ගඟට - කොයි තරම් දෙයක්ද ඒක. කොයි තරම් දෙයක්ද ඒක." පුංචි රසුමන්දි දුක් වු-නෑ, සතුටු වුණා ගොඩක්. තුරුල් කරගත්තා බෝනික්කිව පපුවට, හයියෙන්. ඉක්මනට ගියා ඉවුර දිගේ.

ටිකක් දුර ගිහින් ගඟට බැහැලා පුංචි පැංචි වතුර බිව්වා... හිතෙන් වගේ... බඩ පිරෙන්න... මොන රසද කියලා නම් රසුමන්දිට දැනුණෙ නෑ. වතුර බිව්වද කියලත් මතකයක් නෑ, රසුමන්දිට.

"ඒයි, කවුද මේ !" ගඟෙන් ගොඩට එනකොටම පුංචි කොලු පැංවෙක් කෑ ගැහුවා. තලම්පලා වැල්ගොල්ල උඩ තිබුණු පෙට්ටියක් වටකරගෙන කොලු පැංවො දෙන්නෙක් මොනවදෝ කරනවා. එක කොලු පැංවෙක් ගල් වල අතරෙ නූලක් ගඟට දාගෙන මතිතු මාළුවෝ අල්ලලා පෙට්ටියට දානවා. අනික් පැංවා පෙට්ටියෙන් එළියට පනින මතිතුවෝ ඇහිඳ ඇහිඳ ආයෙත් ඇතුළට දානවා. පෙට්ටියෙන් එළියට පනින පුංචි මතිතුවෝ කට ඇර ඇර තවත් ටිකක් ජීවත් වෙන්න හුස්ම පොදක් ඉල්ලනවා. කොලු පැංවන්ට ඒකෙ වගක් නෑ. සමහර මාළුවෝ නම් කිසිම හැලහොල්මනක් නැතුව ඉන්නවා. සමහරවිට ගොඩට දාලා ගොඩක් වෙලා වෙන්න ඇති. එහෙම නැත්නම් එළොව යන්න හිත හදාගෙන වෙන්න ඇති. කොහොම වුණත් ඒ හැමෝම ආයෙත් කවදාවත් මාළුවෙක් නම් වෙන්න එපා කියලා, නොවැරදිම ප්‍රාර්ථනා කරන්න ඇති...





රසුමන්දි කෙව්ටක් වගේ ඉද්ද ගැහිලා හැරිලා බැලුවා. ඇස් පිල්ලම් නොගහා, බයෙන් බැලුවා. හොඳ වෙලාවට පුංචි කෙල්ලට අහිංසක මතීතුවො ටික කට ඇර ඇර හුස්ම අදින හැටි පෙනුණෙ නෑ, ඈතට.

"ඒයි ! මොනවද හංගගෙන යන්නෙ?" එක පැංචෙක් ආවා රසුමන්දි ළඟට. රසුමන්දි හයියෙන් ගුලි කරගත්තා බෝනික්කිව, මසුරං කෝට්ටියක් වගේ.
"කෝ බලන්න, හොර කෙල්ල !" උදුරගත්තා බෝනික්කිව රසුමන්දිගෙන්. රසුමන්දි හුස්ම අදින මතීතුවෙක් වගේ එල්ලුණා අතේ.

"අපෝ--ඈක්- මේ මොකද්ද?" කොලු පැංචා උඩ දැම්මා බෝනික්කව. අනික් පැංචා උඩ පැනලා ඇල්លුවා. රසුමන්දි දිව්වා ඒ පැත්තට. කොලු පැංචා විසි කළා බෝනික්කව මේ පැත්තට. රසුමන්දි දිව්වා මේ පැත්තට. ආයෙත් ඒ පැත්තට. ආයෙත් මේ පැත්තට. ඒ පැත්තට-මේ පැත්තට දිව්වා--- හත් වේලක් හාමතේ හිටි පුංචි කෙල්ල... හරි සෙල්ලම කොලු පැංචන්ට... ගිනි ඇවිලිලා පුංචි කෙල්ලට... ඊළඟට බෝනික්කා ගල් තලාව උඩ වැටුණා. කොලු පැංචා පාගාගත්තා කකුලෙන්. පුංචි කෙල්ලගෙ හිත හීරුණා. පතුරු පතුරු ගැලවුණා, හිත. අහිංසකයෙකු ඔච්චම් කරන්න හොඳද ඔය තරමට... පුංචි කෙල්ල ගල් ගැහිලා හිටියා.

අන්තිමට බෝනික්කි ඈතට විසි කරලා කොලු පැංචො දෙන්නා ආයෙත් මාළු පෙට්ටියට වටවුණා. බෝනික්කි වැටිච්ච දිහාට පුංචි කෙල්ල දිව්වා, විදුලියක් වගේ. ඇහිඳ ගත්තා බෝනික්කි, කිඹුලියක් වගේ.
පපුවට ගුලි කරගෙන දිව්වා පස්ස නොබලාම. දිව්වා කකුල හැරුණු පැත්තට. නපුරු කොලු පැංචො දෙන්නා ආපහු ආවොත්!

රසුමන්දි දුවලා දුවලා ගිහින් වෙල්ලාව අයිනෙ තිබුණු පුංචි පැලක පිළිකන්නෙ හැංගුණා. "හ්හා - හ්හා - හ්හා- හ්හා -" පුංචි රසුමන්දි හති දැම්මා. ඒ එක්කම හතර වටේ යන්තම් කළුවර වේගෙන ආවා. ඇඟ ඇතුළෙන් හීතල හුළඟක් කැරකෙනවා දැනුණා.
අහ් ! අර කළුවර ලෙඩේ එන්න වගේ හදන්නෙ...



බෑ, බෑ, කළුවර ලෙඩේට එන්න දෙන්න බෑ. රසුමන්දි ඉක්මනට බිත්තියට ඔළුව තියාගෙන බිම වාඩි වුණා. පුංචි කෙල්ල හාමතේ කී වරුවක්ද දැන්? තෙතබු කරල... මතක නෑ දැන් පුංචි කෙල්ලට... කොනිති ගැහුවෙ නෑ බඩ පණුවො... හිරි වැටිලා පුංචි බණ්ඩිය... දැනුණෙ නෑ බඩගින්න... ගිනි ඇවිලිලා පුංචි හිත... ගැහුණා මුළු ඇඟම... පණ තිබුණා කකුල් දෙකේ, ඇබිත්තක්... හයිය තිබුණා හිතේ, මහමෙරක්... බේරගන්න මසුරං පොදිය...

පුංචි කෙල්ල හෙමින් හෙමින් අතේ ගුලිවෙලා මිරිකිලා හිටි බෝනික්කි දිහා බැලුවා. අනේ ! සායම් ඔක්කොම සීරිලා. කැටයම් පතුරු ගැලවිලා. කමක් නෑ, ලී බෝනික්කිවත් ඉතුරු වුණානෙ. පුංචි පැංචි එක තත්පරේට හිත හදාගත්තා. සතුටු වුණා හොඳටෝම. තව තවත් තුරුල් කරගත්තා මසුරං පොදිය, පපුවට. ලිය තදවෙලා පුංචි ඉල ඇට රිදුණා. රසුමන්දිට දැනුණෙ නෑ. පපුව ගිනි අරගෙන ඉන්නකොට ඉල ඇට නම් මොකක්ද !

රසුමන්දි හෙමින් හෙමින් ඔළුව හරවලා වටපිට බැලුවා. වෙල්ලාවෙ රෙදි අපුල්ලමින් හිටි රෙදි නැන්දා කෙනෙක් ඇවිත් පිලිකන්නට එපිටින් තිබුණු ලිපක් මොළවනවා. දර ටික හොඳටම තෙත බැහැලා. රෙදිවලට කැඳ දමාගන්න බැරුව උන්දෑ ලත වුණා. ආයෙත් පිළිකන්නට ආවා, වේලිච්ච දර පතුරක් හොයාගන්න.
“ඈං, මේ කවුද?”රෙදි නැන්දා නළල රැළි කරලා බැලුවා.
“අ--අ--ම--මම--පණ ගිහින් - බෝනික්කිට - පණ ගන්න - මට - බෝනික්කිට - හිනා වෙන්න - බෝනික්කිට පණ ගන්න--” රසුමන්දිගෙ කටින් වචන හැලුණා. තේරුමක් ඇහිඳගත්තා රෙදි නැන්දා. ඇස් දෙක ගියා අතේ හිරවෙලා හිටි ලී බෝනික්කිට. පුංචි කෙල්ලගෙ පපුවෙ ගින්දරට, ඇවිලිලා යන තරම් රත්වෙලා තිබුණු ලී බෝනික්කිට.

“පණ ගන්ට? ඈ? බුනික්කිට? කෝ බලන්ට. හ්ම්, මයෙ ළඟ හොඳ අත් බෙහෙතක් තියෙනවා. කෝ දෙන්ට. බලමු පණ ගන්ට ඇහැක්ද කියලා.” රෙදි නැන්දා කීවා. පුංචි කෙල්ල ආයෙත් රැවටුණා. දර ලී මාමාලා වගේ දෙවිවරු හැම තැනම නැති බව පුංචි කෙල්ල කොහොම දැනගන්නද?



රෙදි නැන්දා බෝනික්කි අරගෙන කළුවර පැළ ඇතුළට රිංගුවා. රසුමන්දි මැටි පෝච්චියක් වගේ දොර දිහා බලාගෙන හිටියා. බලාපොරොත්තු පිරිලා, පුංචි හිතේ සමනල්ලු තටු ගැහුවා. කොයි තරම් හොඳයිද රෙදි නැන්දා හම්බ වුණු එක.

ටික වෙලාවකින් රෙදි නැන්දා දොරෙන් එළියට ආවා. ඒත් අතේ බෝනික්කි නම් හිටියෙ නෑ.
"හරි වැඩේනෙ දරුවො, මම බුනික්කිට බෙහෙත් ගාලා රත් වෙන්න ලිපට උඩින් අල්ලගෙන ඉන්නකොට, වැටුණා නෙව ලිප ඇතුළට. මොනවා කරන්ටද දරුවෝ. බුනික්කි ගෙනා ආච්ච ඔච්චර වෙන්ටැ." රෙදි නැන්දා පශ්චත්තාපෙන් කීවා.

මහපොළොවෙන් ඇදිලා ආ අකුණක්, රසුමන්දිගෙ යටි පතුළෙන් රිංගලා, කකුල් දෙක දිගේ ඇවිත්, පපුව මැද පිපිරුණා. බෙල්ලේ හිරි ගඩු පිපුණා. නළල දෙපැත්තෙන් දාඩිය බේරුණා. පුංචි කෙල්ල පැළ ඉන්නක් වගේ බලා හිටියා... ඔහේ... අත්දෙක බොකුටු වෙලා තද වුණා, බෙල්ල ළඟටත් පපුව ළඟටත්. ඉබේටම වගේ...
"--- කො -- කො -- කොයි තරම් දෙයක්ද -- ම-මගේ --හු-- හුළං බෝනික්කි -- ඉතුරු වුණු එක -- මගේ-හුළං-බෝනික්කි --"
බොකුටු අත්දෙක ගුලි කරගෙන රසුමන්දිගෙ කකුල් දෙක ආපහු හැරුණා.

පුංචි ඇස් දෙක ඈත බලාගෙන - ඔහේ ඈත බලාගෙන - හුළංම හුළං බෝනික්කි තුරුල් කරගෙන - ඉවුර දිගේ පාවුණා. පුංචි කුරුල්ලො එබී එබී බැලුවා. පුංචි කෙල්ලගෙ පුංචි ඇහැක් දිලිසුණා. ඇතුළෙ හිරවෙලා ඉඳලා ඉඳලා ඉන්නම බැරි තැන එළියට පැනපු කඳුළු බිංදුවක්. උණුම උණු කඳුළු බිංදුවක්. නහය අයින දිගේ ඇවිත් තොල උඩට වැටිලා පුංචි නිකට දිගේ බේරුණා. උණුම උණු කඳුළු බිංදුවක් ! පුංචි කුරුල්ලොත් පුදුම වෙලා. කවදාවත් නාඬන පුංචි කෙල්ලගෙ ඇහේ කඳුළු බිංදුවක්.

රසුමන්දිගෙ කකුල් දෙක තවත් දුර ගියා, ඉවුර දිගේ. කොහෙද යන්නෙ? මොකටද? නෑ, දන්නෙ නෑ...



සීතම සීත හුළං රලක් පුළුන් රොදක් වගේ ඇවිත් වට පිට සෝදිසි කරලා ගියා. ඊළඟට ආයෙත් ආවා දඟ දාගෙන. වටේට කැරකුණා දඩබ්බරයෙක් වගේ. කැරකුණා ගස් වැල් නමමින්. කුරුල්ලො, සත්තු කලබල වෙලා හෙවනක් සොයාගෙන ගියා. අනතුරක ඉවක් වගේ. ඉරට යටින් ආ මහා බර වලාකුළු පළාතම කළුවර කළා. අහස වහගත්තා, ඉර දෙයියො නොපෙනෙන්න. වලාකුළු අගිසිවල අමාරුවෙන් එල්ලීගෙන හිටි වතුර බිංදු එක-දෙක පහළට වැටුණා. තුන-හතර පහළට වැටුණා. පහ-හය --- රසුමන්දි රූස්ස කුබකුයෝසා ගහක් යට නැවතුණා. මසුරං පොදිය තෙමුණොත් ! රසුමන්දි හුළං බෝනික්කිව හයියෙන් තදකරලා ගුලි කරගත්තා.

සීත සුළං රළ ටිකෙන් ටික සැර වුණා. තව තව සැර වුණා. රවුම් රවුම් කැරකුණා. දඟර දඟර පැද්දුණා. හුළං රළට විහිළු ! හූ--හූ---හූම්--හෝ--ස්--හෝ--ඕ--- හුළං රළ මුළු සෝනංජා ගං මිටියාවතම බය කරගෙන කැරකුණා. මහා කුණාටුවක් ගෙනෙන්න වගේ. යෝධ කුබකුයෝසා ගස්, දෙකට තුනට ඇඹරුවා. වේලිච්ච කොළ, දිරච්ච අතුඋස්සලාපොළොවෙගැහුවා,යකෙක් වගේ.

හීන් දිගටි කොළ තියෙන බුරුබුරා ගස් ඒ පැත්තට මේ පැත්තට ඇඹරි ඇඹරි හුළං යකාගෙන් බේරෙන්න හැදුවා. වේලිච්ච බුරුබුරා කරල්වල ඇට විසි වෙලා ඇවිත් රසුමන්දිගෙ ඇඟේ වැදුණා, වට පට ගාලා. අතු, ඉති, කොළ, රසුමන්දිගෙ ඇඟේ වැදිලා රිදුණා. රසුමන්දි රූස්ස කුබකුයෝසා කඳට තව තවත් මුවා වුණා.





හුළං යකා ඒ පැත්තට මේ පැත්තට කැරකෙනකොට, රසුමන්දිගෙ ඇඟිලි දෙකක් දාන තරමේ ඉරිලා තිබුණු දිරච්ච ගවුම, ඇඟිලි පහක් දාන තරමට ඉරුණා. වේලිච්ච කොළත් එක්ක ඉරිච්ච පුංචි ගවුම් පොඩියත් ඇදගෙන යන්න වගේ. ගවුම නම් මොකක්ද, හුළං බෝනික්කි ඇදගෙන ගියොත්? බිම වැටි වැටි, ගස්වල හැපි හැපි, ඇදගෙන ගියොත්? බුරුබුරා ඇට වැදිලා බෝනික්කිට රිදුණොත්? අනේ පුංචි කෙල්ල සන්තකට තිබුණු එකම වස්තුව... පුංචි කෙල්ලගෙ පණ... හයියෙන් අල්ලගත්තා, පපුවට තදකරලා.



ඒ එක්කම වගේ මහා වලාකුළු ගොඩකුත් එක සැරේට කඩා වැටෙන්න ගත්තා. බුරුබුරා ඇට තරම් ලොකු වැහි බිංදු අරගෙන හුළං යකා ඉගිල්ලුණා. මිටි ගස් තල්ලු කරලා බිමට නැමුවා. උස ගස් කඩලා පොළොවෙ ගැහුවා. ලොකු වැහි බිංදු...නෙමෙයි, වැහි ගෙඩි... හුළඟට කැරකුණා. ඒවා වැදිලා පුංචි කෙල්ලට රිදුණා. තව තවත් රිදුණා. රිදි පාට මකුළු දැල් අහස පුරා ගිහින් මහ සද්දෙට පිපිරුණා. අහස කීතු කීතුවලට ඉර ඉරා පිපිරුණා. කන් පැළෙන තරම් හයියෙන් පිපිරුණා. අකුණු හඬට පුංචි කෙල්ලට බය හිතේවි. අනේ කන් දෙකවත් වහගන්නෙ කොහොමද? බෝනික්කි අතෑරේවි. බිම වැටිලා තෙමේවි. හුළඟට ගහගෙන යාවි.
නෑ, බෝනික්කි පරිස්සමින්... නිකට යට හෙවනෙ... අත්දෙකේ උණුහුමට ගුලි වෙලා... බෝනික්කිට උණුහුම දිදී පුංචි කෙල්ල වෙවුළුවා, සීතලේ, තෙතබරි වෙලා බලු නකුටෙක් වගේ.



වැහි කුණාටුව ඉවරයක් නෑ. හුළං යකාට හරි සෙල්ලම්. සෝනංජා ගඟේ වතුර පිම්මෙ දුවනවා. සිසිධාරා ඇල්ල ඉහත්තාවෙ ඉඳලා එන වතුර කඳ, සෝනංජා ගඟට දරා ගන්න බැරි තරම්. පිටාර ගලන්නත් ඔන්න මෙන්න වගේ. වතුර දුඹුරුම දුඹුරු පාට වෙලා. තත්පරෙන් තත්පරේ ගඟේ වතුර වැඩි වුණා. රළේ වේගෙ වැඩි වුණා. වැල් පාලමත් ගැලවිලා යන තරම් හයියෙන් වතුර පාර දිව්වා. හුළං යකා ඇවිත් වැල් පාලම ඒ පැත්තට මේ පැත්තට පැද්දුවා.

හුළං යකා කුණාටු සෙල්ලම නවත්වන්නේම නැති හැඩයි. හැබෑටම පෙනෙන්නෙ නැද්ද අසරණ පුංචි දරුවෙක් ගහක් යට ගුලිවෙලා සීතලේ හාමතේ ගැහෙන හැටි? වගක් නෑ හුළං යකාට. ඒ පැත්තට යනවා. මේ පැත්තට එනවා. කැරකි කැරකි කැරකි කැරකි හූ---හූ---හූ---හූම්---- කිය කියා බයංකාර සද්දෙන් ඇඹරෙනවා. එහෙන් ඇවිත් මෙහෙන් ඇවිත් ගස් පෙරළනවා.

හුළං යකා අන්තිමට ඇවිත් රසුමන්දි හෙවනට හිටි යෝධම යෝධ කුබකුයෝසා ගහ වටේත් කැරකුණා. හෙමින් හෙමින් කැරකුණා. හයියෙන් හයියෙන් කැරකුණා. කරකවලා කරකවලා කරකවලා, උඩ පැන්නා. ඒ පැත්තට පද්දලා, මේ පැත්තට පද්දලා යෝධ කුබකුයෝසා ගහ ඉගිළුවා. මහා සද්දෙන්, කැලේ දෙවනත් කරගෙන, කුබකුයෝසා ගහ පෙරළීගෙන ආවා. චර - චර - බර - බර - කර - කර- පුංචි පැංචි උඩ බැලුවා. මෙච්චර වෙලා හෙවන දුන්නු ගහත් ඇඟ උඩටම ඇල වුණා. හිතා ගන්න බැරි වුණා කිසිම දෙයක්. මොනවා කරන්නද? කොහේ දුවන්නද? කොහේ හැංගෙන්නද?





පුංචි කෙල්ල දිව්වා, නෙමෙයි දිවවුණා. ඔළුව හැරුණු පැත්තට... නෑ, කකුල හැරුණු පැත්තට. ගහත් ඇලවේගෙන ආවා ඒ පැත්තටම. පැංචි තවත් හයියෙන් දිව්වා. මසුරං පොදිය නිකට යට ගුලි කරගෙන දිව්වා, නොදැනීම දිවුණා. බයවුණු තරමට නොදැනීම දිවුණා වැල්පාලම ළඟටම... ගොඩ වුණා වැල් පාලමට... හීනෙන් වගේ. යන්නෙ කොහොමද පාලම දිගේ? අත් දෙකෙන්ම බදාගෙන හුළං බෝනික්කි -- අතාරින්න බෑ එක අතක්වත්. හුළඟෙ ගියොත් බෝනික්කි? ගඟට වැටුණොත් බෝනික්කි? ගඟේ ගිලුණොත් බෝනික්කි? අනේ පව් !

රසුමන්දි හුළං බෝනික්කි ගුලි කරගෙන හෙමින් හෙමින් අඩිය තිබ්බා වැල් පාලමේ. කකුල් දෙක වෙවුළුවා සට සට ගාලා. ඒ වෙනකොට අට වේලක් හාමතේ පුංචි කෙල්ල. වෙවුලන පුංචි කකුල් හෙමින් හෙමින් ඇදුණා පාලම දිගේ. සෝනංජා ගඟට දරාගන්න බැරුව මහා වතුර කඳ පිටාර ගැලුවා. ඉවුරු කඩාගෙන පිටාර ගැලුවා. වැල් පාලම යටින් මහා සද්දෙන් වතුර කඳ දිව්වා. ගස් කඳන්, කොළ, අතු ඇදගෙන වේගෙන් ගියා.

වැල් පාලම මැදදි පුංචි රසුමන්දිගෙ පිට දිගේ හීනියට ඇවිලීගෙන ගියා. ඇඟ ඇතුළෙන් අමුතු සීතල හුළඟක් හමාගෙන ආවා. අමුතුම සීතල හුළඟක්. අර කළුවර---අර වටේටම කළුවර වේගෙන එන---අර ඇඟ පණ නැති වෙලා-සීතලත් එක්ක--දාඩිය දාලා--දාඩිය දාලා---කළුවර වෙලා-කළුවර වෙලා---කළුවර වෙලා----





සෝනංජා ගඟේ මහා වතුර කඳ පුංචි කෙල්ල ඔතාගෙන ගියා. අට වේලකින් බඩට කෑමක් නැති පුංචි කෙල්ල අරගෙන ගියා. සෝනංජා ගඟ විලාප දුන්නා--- හෝ-හෝ-හෝ ගාලා--ගඟට ඉවසගන්න බෑ. සෝනංජා ගඟ ඒ පැත්තට මේ පැත්තට හැරිලා බේරගන්න හැදුවා අසරණ පණ කෙන්ද. ඒත් බැරි වුණා. කිව්වා නාහන මහා වතුර කඳ... ඈතට ඈතට ඇදගෙන ගියා. කවුද ඉන්නෙ බේර ගන්න අසරණ හා පැටික්කි?

හුළං යකා නැවතුණා ගැස්සිලා. දැක්කා පුංචි කෙල්ල යනහැටි ගංවතුරෙ. ඇතිද කළ සෙල්ලම? ඇතිද?? දැක්කද වෙච්ච දේ පුංචි කෙල්ලට?

--බේර ගන්න පුංචි කෙල්ල- අනේ කවුරුත් නැද්දෝ- මහ පොළොව විලාප දුන්නා. --අනේ හංගන්න එපා පුංචි කෙල්ල ගං පතුළෙ--- ගස් වැල් කුරුල්ලෝ කෑ ගැහුවා- ඒ තරම් පුංචි දරුවෙක්! කාගෙවත් උණුහුමක් නොලැබුණු පුංචි දරුවෙක්! ආදරේ පොදක් නොලැබුණු පුංචි දරුවෙක්! හංගන්න පුළුවන්ද ගං පතුළෙ, මෙච්චර නපුරු විධියට?

පුංචි කෙල්ල වතුර පාර එක්ක ඇදිලා ගියා. ඈතට ඈතට ඇදිලා ගියා. පීනන්න, දඟලන්න, උදව් ඉල්ලලා කෑ ගහන්න, එල්ලෙන්න වැල් පොටක, බේර ගන්න පණ කෙන්ද... සිහියක් තිබුණෙ නෑ පුංචි කෙල්ලට. අත්දෙක ගුලිවෙලා නිකට යට.

ගස් වැල් මැලවිලා. වලාකුළු ගොළුවෙලා, හුළං යකා බයවෙලා, වැහි කුණාටුව නැවතිලා....





පුංචි පපුව ගැහෙන හඬ ඇතට ඇතට ඇතට ඇහුණා
කාටදෝ ඇහුණා - කාටදෝ දැනුණා - කාටදෝ පෙනුණා
ටිකෙන් ටික---එළිය වුණා ගං ඉවුර පුදුමෙකින් වගේ...
අමුතු එළියක් - විදුලියක්ද? අකුණක්ද? හීනයක්ද?
---දික් වුණා පුංචි අතක් ගඟ දිහාට. අහු වුණා කොනක්
දිරව්ච පුංචි ගවුමෙ. ඇදලා ගත්තා හෙමින් හෙමින්
හෙමින් හෙමින් හෙමින් ගං ඉවුරට.
සීතල වෙව්ච මූණු පොඩිය තුරුල් කරගත්තා පුංචි
අත්දෙකකින් --- රසුමන්දිට දැනුණා පුරුදු උණුහුමක්.
පුරුදු උණුහුමක් - ඇස් ඇරලා බැලුවා, හෙමින් හෙමින්.
--- තවමත් අත් දෙක හිර කරගෙන නිකට යට.
ගුලි කරගෙන මසුරං පොදිය ---
පුංචි කෙල්ල ඇස් පිය ගැහුවා. සුදුමැලි වෙව්ච තොල්
පිපුණා. පුංචි කටේ කොන් දෙක දික් වුණා කන් දෙක
ළඟට. --- හිනැහුණා පුංචි කෙල්ල -- හීනෙන් වගේ -
- දෙකක් නැති දත් ටික පෙන්නලා ---
සතුට දැනුණා පුංචි හිතට ගොඩක් ගොඩක් ගොඩක්
ගොඩක් ගොඩක් ගොඩක් ගොඩා-----ක්
මිමිනුණා තොල් අතරින් ---
"---හු-හුළං--බි-බි-බි බෝනික්කි !"



